<u>දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම - අම්පාර</u>
<u>රැස්වීම් වාර්තාව</u>

01. දිනය :- 2024.02.14 වේලාව :- පෙ.ව. 09.30

02. ස්ථානය :- ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර.

03. ප්‍රධානත්වය :- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පලාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා

04. මෙහෙයවීම :- දිස්ත්‍රික් ලේකම් චින්තක අබේවික්‍රම මහතා

05. සහභාගීත්වය :- මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වූ දේශපාලන අධිකාරිය, නැගෙනහිර පළාත් සභාවේ හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන් සහ ආරක්ෂක අංශවල ප්‍රධානීන්ගේ පැමිණීමේ ලේඛනය අමුණා ඇත. (ඇමුණුම 1)

06. **පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම** :- දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිතුමන් විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව අමතමින්, පැමිණි සිටි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා, සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ඇතුලු පළාත් සභාව නියෝජනය කරමින් පැමිණි හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන් ඉතා සුහදව පිළිගන්නා ලදී. අනතුරුව ගරු. සමසභාපතිවරුන් වෙත දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භාර දෙන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා, සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, දිස්ත්‍රික් ලේකම් ඇතුළු සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, සියලුම ආයතන ප්‍රධානීන්, සියලුම ආරක්ෂක අංශවල ප්‍රධානීන් සහ අම්පාර දිස්ත්‍රික්කයේ සියලු රාජ්‍ය නිළධාරීන් පිළි ගන්නා ලදී. ඉන්පසු මෙවර අම්පාර දිස්ත්‍රික්කයට බලපෑ ගංවතුර තත්වයෙන් විශාල හානියක් අප දිස්ත්‍රික්කයට සිදුවූ බවත්, එබැවින් ජනතාව අසීරුතාවට පත්වූ බවත් පැවසීය. එම අවස්ථාවේදී ඒ තත්වයයන් කඩිනමින් යථාතත්වයට පත් කිරීමට නිතරම දුරකථන මාර්ගයෙන් සම්බන්ධවී උපදෙස් ලබාදුන් අතිගරු ජනාධිපතිතුමන්ටද, ඒ අවස්ථාවේ ජනතාවට අවශ්‍ය පහසුකම් සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත් නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමාටද, ප්‍රධාන ලේකම්තුමා ඇතුලු පළාත් සභා සියලුම නිළධාරීන්ටද, දිස්ත්‍රික් ලේකම්තුමා සහ සියලුම රාජ්‍ය නිළධාරීන්ටද, ත්‍රිවිධ හමුදාව, පොලිසිය සහ සිවිල් ආරක්ෂක බලකා නිළධාරීන්ටද, සර්වෝදය, ජාතික තරුණ සේවා සභාව, රාජ්‍ය නොවන සංවිධාන හා මාධ්‍ය නිළධාරීන්ටද ඔවුන් දැක්වූ සහයෝගයට ස්තූතිය පිරිනමන ලදී. ඉන්පසු ජාතික මට්ටමින් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන හා ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගති සමාලෝචනයට සහ 2023/2024 මහ කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්තුමන් වෙත ආරාධනා කරන ලදී.

**07. ජාතික මට්ටමින් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන හා ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය.**

**7.1 2023/2024 මහ කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීම.**

මෙවර ඇතිවූ ගංවතුර තත්වය හේතුවෙන් කුඹුරු අක්කර 42000ක් පමණ හානියට පත්ව ඇති බව දිස්ත්‍රික් ලේකම් සඳහන් කරන ලදී. එසේ වුවද ජනවාරි මස වන විට මෙම කන්නයේ අස්වැන්න නෙලීම ආරම්භ කර ඇති බවත් සඳහන් කරන ලදී. ඒ අනුව මේවන විට මෙට්‍රික් ටොන් 57838.74ක අස්වැන්නක් ලබාගෙන ඇති බවත් තවමත් අස්වැන්න නෙලීමේ කටයුතු සිදුවන බවත් පැවසීය. සම්පූර්ණ අස්වැන්න නෙලීමෙන් පසුව සිදුව ඇති වගා හානිය ගනන් බලා පසුව

ප්‍රකාශ කරන බවත් එතුමා තවදුරටත් පැවසීය. මෙවර මහ කන්නයේ විශාල අස්වැන්නක් බලාපොරොත්තු වුවද ගංවතුර තත්ත්වය නිසා ඇති වූ වගා හානිය ලොකු ගැටළුවක් වූ බව දිස්ත්‍රික් ලේකම් ප්‍රකාශ කරන ලදී.

රාජ්‍ය පරිපාලන හා පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ නායකත්වයෙන් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් මෙවරත් ගිවිසුම්ගතව ජනතාවට ප්‍රතිලාභ සපයමින් සාර්ථකව ක්‍රියාත්මක කරනු ලබන බවත් දිස්ත්‍රික් ලේකම් විසින් සඳහන් කරන ලදී.

ඉන්පසු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා විසින් පසුගිය 2023.11.30 පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වාර්ථාවේ යම් අඩුපාඩු ඇත්නම් සභාවට දන්වන ලෙස දැන්වීය. එවිට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා අල්සඟා විද්‍යාල ගැටළුව සම්බන්ධයෙන් විමසන ලදී. එවිට පලාත් අධ්‍යාපන ලේකම් විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමාගේ උපදෙස් පරිදි එම කටයුතු සිදුකරන ලෙස පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හරහා එම පාසලේ විදුහල්පතිට දැනුම් දී ඇති බව සඳහන් කරන ලදී. නමුත් මෙය තවම ඉටුවී නොමැති බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා විසින් පවසන ලදී. එවිට මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් විසින් අදහස් දක්වමින් මෙම කරුණ සම්බන්ධයෙන් විමර්ශණය කල බවත් පාසලේ තිබූ නම පාසල් සංවර්ධන සමිතියේ ඉල්ලීම මත පාසල් ව්‍යුහ කමිටුව මගින් විධිමත් ලෙස වෙනස්කර ඇති බවත් නැවතත් නම වෙනස් කිරීමට අවශ්‍ය නම් ඒ ආකාරයට සිදුකල හැකි බවත් පැවසීය. තවද මේ සම්බන්ධයෙන් නඩු කටයුත්තක්ද පවතින බව සඳහන් කරන ලදී. එවිට තවමත් නඩුකටයුත්තේ තීන්දුව ලැබී නොමැති නිසා පෙර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ගනු ලැබූ තීරණය අනුව අදාල පාසලේ නාමපුවරුව හෙට එනම් 2024.02.15 දින වන විට වෙනස් කරන ලෙසත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා විසින් කලාප අධ්‍යාපන අධක්ෂකට දැනුම් දෙන ලදී. එය විදුහල්පති ඉටු නොකරන්නේ නම් ඔහුට විරුද්ධව විනයානුකූලව කටයුතු කරන ලෙසත් පළාත් අධ්‍යාපන ලේකම්ට උපදෙස් ලබාදුණි.

**09. දිස්ත්‍රික් මට්ටමින් දේශීය හා විදේශීය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය**

**9.1 උරුමය ජාතික වැඩසටහන පිළිබඳ ප්‍රගතිය ඉදිරිපත් කිරීම**

ගරු ජනාධිපතිතුමාගේ 2024 අයවැය යෝජනාවක් අනුව ජනතාවට සින්නක්කර ඔප්පු ලබාදීමේ උරුමය නම් වැඩසටහනක් ක්‍රියාත්මක බව ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරී පැවසීය. මෙම උරුමය වැඩසටහන සඳහා විශාල කාර්යභාරයක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවට පැවරී ඇති බවත් සඳහන් කරන ලදී. 2023.12.18 ආරම්භ කල මෙම වැඩසටහන අනුව මාසයක් ඇතුලත අම්පාර දිස්ත්‍රික්කය තුල දීමනාපත්‍ර 2000 පමණ සාදා නිමකල බවත් සඳහන් කරන ලදී. මෙම වැඩසටහනේ දෙවන අදියර ද මේවන විට ආරම්භකර ඇති බවත් තවදුරටත් සඳහන් කරන ලදී.

**9.2 ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරියේ එක්ගල්ඔය බීජ මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථානය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධව සාකච්ඡා කිරීම**

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පැවති ඉඩම් ගැටළුව මේවන විට විසදී ඇති බවත්, ප්‍රාදේශීය ලේකම්ගේ ලිපිය ලැබුණු විගස එහි වැඩ ආරම්භ කල හැකි බවත් ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරියේ නිලධාරියා විසින් සඳහන් කරන ලදී. දැනට තිබෙන වැංකිවල සංවර්ධන වැඩ කටයුතු ආරම්භ කර ඇති බවත් මේ වසර අවසන් වන විට සම්පූර්ණයෙන්ම මෙම ව්‍යාපෘතිය අවසන් කල හැකි බවත් පැවසීය.

**9.3 කෘෂි නවීකරණ ව්‍යාපෘතිය (ASMP)**

මෙම වැඩසටහනට අදාළ ව්‍යාපෘති වල මේ වනවිට ප්‍රගතිය හා වැඩකටයුතු පිළිබඳව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් පැහැදිළි කරන ලදී.(ඇමුණුම 02) කටුඅනෝදා ව්‍යාපෘතිය ක්‍රියාත්මක බව ද ඒ සඳහා පදියතලාව ඉඩම සම්බන්ධයෙන් ගැටලුවක් ඇති බව ද සඳහන් කරන ලදී. එවිට පදියතලාව ප්‍රාදේශීය ලේකම් විසින් එම ඉඩම සම්බන්ධයෙන් මහවැලි අධිකාරියෙන් අනුමැතිය ලබාදන බව පැවසීය. මෙම ව්‍යාපෘතියේ ඉඩමට යාමට ඇති මාර්ගය වන සමන්ගල පාර මෝටර් ග්‍රේඩර් කර සකස් කර දෙන ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටින ලදී.

**9.4 වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන ( CresMPA ) අදාළ ව්‍යාපෘති ප්‍රගතිය**

මෙම වැඩසටහන යටතේ වැඩ කොටස් 51 හඳුනාගෙන ඇති බව වාරිමාර්ග අධ්‍යක්ෂ පවසන ලදී. තවද ක්‍රමවේද 4ක් යටතේ මේ සඳහා සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරන බවද පැවසීය. මේවන විටත් මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් ලෝක බැංකු නිලධාරීන්ගේ සමීක්ෂණ කටයුතු සිදුකරන බවත් පැවසීය. වාරිමාර්ග යටතේ ඇස්තමේන්තු සියල්ල අමාත්‍යාංශය වෙත යවා ඇති බවත් පවසන ලදී. ගොවිජන සේවා සහ පලාත් වාරිමාර්ග ඇස්තමේන්තුද වහාම යැවීමට සූදානම් කරන බව ද සඳහන් කරන ලදී.

මෙහිදී ගංවතුරට හානිවුන ස්ථාන පිළිසකර කිරීම මග නතර කර ඇති බවට ගොවි සංවිධාන විසින් චෝදනා කරන බැවින් එහි සත්‍යතාවය පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා විසින් විමසා සිටින ලදී. එහිදී මහ කන්නයේ වගා සහ අස්වනු නෙලීමට අවශ්‍ය පිළිසකර කිරීම් කරන ලද බවත්, යල කන්නයට අවශ්‍ය පහසුකම් සැපයීමට කටයුතු කරමින් සිටින බවත්, ඉදිරි සතියතුල ඊට අදාල ඇස්තමේන්තු සකස්කර අවසන් කරන බවත් වාරිමාර්ග අධ්‍යක්ෂ පවසන ලදී. කෙසේ වුවද මෙම කන්නයේ වගාකටයුතු ආරම්භ කිරීමට 2024.03.31 දක්වා කල් ලබාදෙන ලෙස එතුමා තවදුරටත් ඉල්ලා සිටින ලදී.

**9.5 වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඒකාබද්ධ ජලධාරා හා ජලසම්පත් කළමණාකරණ ව්‍යාපෘති (IWWRMP) ප්‍රගතිය**

මේ යටතේ අයිතම 33කට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලැබී බවත් ඉන් අයිතම 29ක් සඳහා මිලියන 78ක ප්‍රතිපාදන ලැබී ඇති බව සඳහන් කරන ලදී. අක්කරපත්තුව ව්‍යාපෘති දෙකක් හැර අනෙක් සියල්ල අවසන් කල හැකි බව වාරිමාර්ග අධ්‍යක්ෂ පැවසීය.ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක ලෝක ආහාර වැඩසටහනේ ප්‍රතිලාභීන් තෝරාගත් ආකාර පිළිබඳ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා සිය අප්‍රසාදය පල කරන ලදී.

**10. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු යෝජනා**

| අනු අංක | යෝජනාව | තීරණය |
|---|---|---|
| **01** | වෙරළබඩ තීරයේ සහ කලපු ප්‍රදේශවල රජයේ ඉඩම් බොහෝමයක් උපරිම ආර්ථික වටිනාකමක් ලබා ගැනීමට ප්‍රයෝජනයට නොගන්නා බැවින් , එම හඳුනාගත් ඉඩම් දැනට ගෝලීය ඉල්ලුමක් ඇති කඩොලාන වගා කටයුතු සඳහා භාවිතා කල හැකි අතර කාබන් සහතිකය ද ලබා ගැනීමට හැකියාව ඇත. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය හිමි විය. |
| 02 | විමධ්‍යගත අයවැය යෝජනා 2024 අනුමත කර ගැනීම | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය හිමි විය. |
| 03 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තු සමීක්ෂණයට අනුව හඳුනාගන්නා ලද නාගරික ප්‍රදේශ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු නිර්දේශ සහිතව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය හිමි විය. |
| 04 | දමන මහ විද්‍යාලයේ ව්‍යාපෘති වාර්තාව අනුමත කර ගැනීම | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය හිමි විය. |
| 05 | HF Brothers පාංශු ගබඩා කම්හලේ පස් බැහැර කිරීම සම්බන්ධ යෝජනාව අනුමත කිරීම සඳහා | භූ විද්‍යා, පරිසර, වාරිමාර්ග යන ආයතනවල සහ ප්‍රාදේශීය ලේකම්ගේ අධීක්ෂණය යටතේ මාස 6ක් ඇතුලත මෙම කම්හලේ කටයුතු ස්ථිරව අවසන් කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී තීරණය විය. මීට අමතරව මතුවූ අදහස් අනුව නාමල්ඔය ගල්කොරිය වහාම නතර කිරීමට කටයුතු කරන ලෙස අම්පාර ප්‍රාදේශීය ලේකම්ට |

| | | |
|---|---|---|
| | | දැනුම්දුන් අතර එම කොරියට ලබාදුන් බලපත්‍රය අවලංගු කරන ලෙස ප්‍රාදේශීය සභා ලේකම්ට දැනුම් දෙන ලදී. මේ සම්බන්ධ ලිපියක් පරිසර අමාත්‍යාංශයට යවන බව සඳහන් කරන ලදී. |
| 06 | මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් අලුත්වැඩියාව සඳහා ඉදිරිපත් කල මාර්ග 20ක් සඳහා අනුමැතිය ලබා ගැනීම | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය හිමි විය. |

## 11. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර විසඳුම් නොලැබුණු විශේෂ ගැටළු

| අනු අංක | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01. | අම්/ ගාමිණී මහා විද්‍යාලය පිටුපස මොන්ටි හෝටලය අසල කුඹුරු යායට යන පටු මාර්ගයේ පාසල් සිසුන් හා උපකාරක පංති යන ශිෂ්‍යයින් නීති විරෝධී මත්ද්‍රව්‍ය පානය කිරීමට පුරුදු වී සිටීම නවතාලීම | මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට ශ්‍රී ලංකා පොලිසියට දැනුම් දෙන ලදී. |
| 02. | අම්පාර කල්මුණ ප්‍රධාන මාර්ගයේ කල්මුණේ හංදිය අසල මාරක රිය අනතුරු කිහිපයක් මෑත කාලයේ දී සිදු වී ඇත. රියදුරන්ගේ රථයේ වේගය පාලනය කර ගැනීම සඳහා ආරක්ෂක ගැටි ස්ථාපිත කිරීමට යෝජනා කිරීම | ශ්‍රී ලංකා පොලිසියේ සහය ලබාගෙන සුදුසු පරිදි ආරක්ෂක ගැටි ස්ථාපනය කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. |
| 03. | ඌරුමස් හංදියේ සිට කාර්මික පෙදෙස දක්වා යන මාර්ගයේ තිලක් පොත්හල අසල ඇති බෝක්කුව කැඩී අබලන් වී ඇත. | මෙය ඉටු කිරීමට තීරණය වී ඇති බව දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වෛද්‍ය තිලක් රාජපක්ෂ මැතිතුමා විසින් සඳහන් කරන ලදී. |
| 04. | මෑතක දී ප්‍රකාශයට පත් කරන ලද නැගෙනහිර පළාත්, කල්මුණ සම්මන්තුර අක්කරපත්තුව අධ්‍යාපන කලාප ආදියෙහි වාර්ෂික ගුරු ස්ථාන මාරුවීම් සම්බන්ධව | අභියාචනා සඳහා ලබාදී තිබූ කාලය 2024.02.16 තෙක් දීර්ඝ කරන ලෙසද, සියලුම ස්ථාන මාරු දිස්ත්‍රික්කය තුල පමණක් සිදු කිරීමට තීරණය විය. ස්ථානමාරු පුරප්පාඩු පවතින ආසන්නතම ස්ථානයට ලබාදෙන ලෙසද උපදෙස් ලබාදුණි.<br>අම්පාර ගුරුවරු ත්‍රිකුණාමලයේ දීර්ඝ කාලයක් සේවය කරනු ලබන අතර ස්ථානමාරු ලබා ගැනීමට අපහසුව ඇති බව දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා පවසන ලදී. මේ සඳහා පොලොන්නරුවේ සුදුසුකම් සහිත ළමුන් පුහුණුකර යොදාගෙන හෝ මේ ගැටළුව විසඳිය යුතු බවට අදහස් ඉදිරිපත් විය. ඒ අනුව මේ ගැටළුව DCC අනුමැතිය ලැබුණ ගැටළුවක් ලෙස පාර්ලිමේන්තු ආංශික අධ්‍යාපන කාරක සභාවට යෝජනා කිරීමට ප්‍රධාන ලේකම් විසින් යෝජනා කරන ලදී. |
| 05. | පසුගිය ගංවතුර ආපදාවට අදාළව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් දැනට සිදු කරන ප්‍රතිසාධන කටයුතු සම්බන්ධයෙන්<br>පසුගිය ගංවතුර ආපදාවට අදාළව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් දැනට සිදු කරන ඉංජිනේරු කටයුතු සම්බන්ධයෙන් | යල කන්නයේ මුළු ඉඩම් ප්‍රමාණයම අස්වැද්දීමට ජලය ලබාදීමට බලාපොරත්තුවන බවත් එය මාර්තු මස 30 පමණ වනු ඇති බවත් සඳහන් කරන ලදී. මෙහිදී සම්මන්තුර බන්ට් එක ස්ථාවරව සැකසීමට බලාපොරත්තු වන බවත් ඒ සඳහා ඇස්තමේන්තු සකසා ඇති බවත් වාරිමාර්ග අධ්‍යක්ෂක පවසන ලදී.ඊට අදාල අනුමැතිය ලබාදී ඇති බැවින් අදාල පස් කැපීමේ කටයුතු කර ඉදිරි කටයුතු කරන ලෙසත් පරිපූරක ඇස්තමේන්තුවකින් අවශ්‍ය මුදල් ලබාදීමට ජනාධිපතිතුමා එකඟ වී ඇති බැවින් ඇස්තමේන්තු යවන ලෙසත් දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා පවසන ලදී. |

| | | |
|---|---|---|
| 06 . | පසුගිය ගංවතුර හේතුවෙන් ඕලුවිල් ප්‍රදේශයේ අෂ්රෆ් නගර් ප්‍රධාන මාර්ගයට සිදු වූ හානිය පිළිසකර කිරීමට මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති පිළියම් | මෙය ඉක්මනින් ඉටුකිරීමට ප්‍රධන ලේකම් වෙත උපදෙස් ලබාදුනි.පුරාවිද්‍යා වටිනාකමක් ඇති නටබුන් ලැබී ඇති බැවින් සතියක් තුළදී එම අධ්‍යයන කටයුතු කර ඊට සුදුසු පිළියමක් ඉක්මනින් ගන්නා ලෙස අදාල පාර්ශව වලට දැනුම් දෙන ලදී.<br>මේවගේ අවස්ථා වලදී සාමාන්‍යයෙන් කටයුතු කරනුයේ අදාල අධ්‍යනයෙන් පසු එම ව්‍යුහයට හානි නොවන ලෙස පුරවා සංරක්ෂණය කර එම ස්ථානයේම අදාල සංවර්ධන කටයුතු කිරීම බව පුාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ පවසන ලදී. මේ සඳහා කාලය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. |
| 07. | අම්පාර වාරිමාර්ග කාර්යාලය මඟින් නව වැලි කැණීම් බලපත්‍රකරුවන්ට නව බලපත්‍ර ලබා ගැනීමේ දී සහ බලපත්‍ර දීර්ඝ කිරීමේ දී නිසි ක්‍රමවේදයක් නොමැති බැවින් වැලි කැණීමේ යෙදෙන්නන්හට අම්පාර වාරිමාර්ග කාර්යාලයෙන් අසාධාරණකම් සිදුවීම සම්බන්ධව සොයා බලා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම | දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විමලවීර දිසානායක මැතිතුමා විසින් භූ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් වසරක් සඳහා බලපත්‍ර නිකුත් කලත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මාස 3 කාලයක් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කරන බව සඳහන් කරන ලදී. එහිදී වාරිමාර්ග අධ්‍යක්ෂ බලපත්‍රලාභීන් විසින් අදාල නිධියෙන් වැලි ඉවත් නොකර ආසන්න වෙනත් ස්ථාන වලින් වැලි ලබාගෙන සිදුකරන වංචනික ක්‍රියා හේතුවෙන් මෙසේ බලපත්‍රලබා දෙන බවත්, මෙම වංචනික ක්‍රියා හේතුවෙන් මෙවර ගංවතුර තත්වයේදී ප්‍රධාන නිර්මිතයන්ට පවා විශාල හානි සිදුවූ බවත් පවසන ලදී.. ලිපිලේඛණ සැකසීමට යම් කාලයක් ගතවන හෙයින් සාධාරණ කාලයක් වැඩිකර දීමට වාරිමාර්ග අධ්‍යක්ෂ එකඟ විය. |
| 08. | මහවනාවෙල කාර්යාලයටම අනුයුක්ත සිවිල් ආරක්ෂක බලකා නිළධාරීන් දිස්ත්‍රික් නියාමකගේ අභිමතය පරිදි විශේෂ රාජකාරී සඳහා යොදවා ගැනීම. | අලි පලවාහැරීම් පුහුණු නිලධාරීන් මාරු කරන්නේනම් ඒ වෙනුවට වෙනත් පුහුණු නිළධාරියෙක් යෙදවීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදුණි. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු යෝජනාවක් ලෙස සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන්ට ගිණි අවි ලබාදෙන ලෙස ඉල්ලා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ට ලිපියක් යවන ලෙස දැනුම් දෙන ලදී. |
| 09. | අනතුරුදායක ගස් කැපීමේ දී Dialog – Sierra ආයතනය මඟින් අදාල කටයුතු ප්‍රමාද කිරීම හා එම කටයුතු සංවිධානය කිරීමට යෝජිත දින වල නොපැමිණීම නිසා සිදුවන අපහසුතා වළක්වා ගැනීම. | අදාල සියලුම පාර්ශවවලට කල්වේලා ඇතිව දින දැනුම් දී ගස්කපා ඉවත් කිරීමට කටයුතු කිරීමට තීරණය විය. |
| 10. | I road ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද සරණගම මාර්ගයට ජලය බැස යාම පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය හා NEM ආයතනයේ ඉල්ලීම පරිදි බලහිඳතලාව මාර්ගයේ කාණු පද්ධතියෙන් බැස යාමට සැලසීමේ දී පෞද්ගලික ඉඩම් හිමියන්ට වන අපහසුතාවයට විසඳුම් ලබා දීම. | I road ව්‍යාපෘතිය අවසන් කර අදාල මාර්ග ප්‍රාදේශීය සභාවට බාරදී ඇති බව සඳහන් කරන ලදී. ඊලඟට පැමිණෙන ව්‍යාපෘතියකින් මෙම කටයුතුවලට ප්‍රමුඛතාව ලබාදී මෙම කටයුතු කරන මෙන් උපදෙස් ලබාදෙන ලදී. |
| 11. | දැනට භාවිතා කරන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය අබලන් වීම හා ප්‍රමාණවත් ඉඩක් නොමැති වීම හේතුවෙන් කාර්යාලය අසල පිහිටි ධීවර දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ල භාවිතා කිරීමට අවසර ඉල්ලීම | ස්ථිර විසඳුමක් ලබාදෙනතුරු තාවකාලිකව එම ගොඩනැගිල්ල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයට භාවිතයට ගැනීමට අවසර දීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ සම්බන්ධයෙන් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්වීමට තීරණය විය. |

| | | |
|---|---|---|
| 12. | 01 පන්නල්ගම වඩිච්චලේ හරහා එන ජලය ලබා ගැනීම සඳහා ඇනිකට් එක ප්‍රතිසංස්කරණය කිරීම හා යකඩ දොර ස්ථාපිත කිරීම.<br>02. කට්කඩවත්හි ඇනිකට් ප්‍රතිසංස්කරණය කිරීම හා යකඩ දොර ස්ථාපිත කිරීම | මෙම ව්‍යාපෘතිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමත කරන අතර මුදල් ලැබීමේදී මේ සඳහා ප්‍රමුඛතාව ලබාදීමට තීරණය විය. |
| 13. | තිරුක්කෝවිල් මෙතෝදිස්ත මිෂන් පාසල විසින් දැනට ක්‍රීඩා පිටියක් ලෙස භාවිතා කරන පෞද්ගලික ඉඩම වෙනුවට වෙනත් ඉඩමක් LRC වෙත ලබා දීමට අවසර ලබා දීම | මෙයට දීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයතුල ඉඩමක් නොමැති බවත් ඊට 5Km පමණ දුරින් නම් ලබා දීමට හැකි බවත් ප්‍රකාශ කරන ලදී. ප්‍රාදේශීය ලේකම්ට ඉඩම් හිමිකරු සමග සාකච්ඡාකර ලබන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට දැනුම්දෙන ලෙස දැන්විය. |
| 12. | ඉරක්කාමම් ප්‍රදේශයේ පිහිටි පෞරාණික විල්ලිකුලම් දීර්ඝ කාලයක සිට ප්‍රතිසංස්කරණය කර නොතිබීම හේතුවෙන් එහි මායිම් අනවසරවෙන් අත්පත්කරගැනීම හේතුවෙන් අඩු වූ ජල ධාරිතාව නැවත වැඩි කර ගැනීම | වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් අනවසර අත්කරගැනීම නැවැත්වීමට කටයුතු කරන බව පැවසීය |
| 15. | පෞද්ගලික ආයතනයක් විසින් ක්‍රියාත්මක කරන ලද උහන බඩුන් කහ ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් බැංකු ණය ලබාගත් ගොවීන් අසරණභාවයට පත්වී ඇත. එම ගොවීන්ට ස්ථිර විසඳුමක් ලබා ගැනීම. | මෙම ගැටළුවට හේතුව රක්ෂණ ආයතනය විසින් වන්දි ලෙස ප්‍රමාණවත් මුදලක් නොගෙවීම බව සණස බැංකු නියෝජිත විසින් සඳහන් කරන ලදී. අවසන් සාකච්ඡාවක් සඳහා හෙටදින (2024.02.15)රක්ෂණ ආයතනය කැඳවා ඇති බවත් ප්‍රමාණවත් මුදලක් ගෙවීම වෙනුවෙන් පූර්ණ ලෙස කැපවෙන බවත් සඳහන් කරන ලදී.මෙහි ප්‍රගතිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට දන්වන ලෙසද බැංකු නියෝජිතට දන්වන ලදී. |
| 16. | ආරක්ෂක හේතුන් මත යුධ සමයේ වසා දැමූ, හිඹුරාව ගුවන් හමුදා කඳවුර හරහා අම්පාරට දිවෙන බී ශ්‍රේණියේ ප්‍රධාන මාර්ගය තවදුරටත් වසා දැමීම හේතුවෙන් පවුල් 1000 ක පමණ ජනතාවට අම්පාර නගරයට යාමට ඒමට උහන හරහා අමතර කිලෝ මීටර් 18 ක් පමණ දුර ගෙවා යාමට සිදුවේ. එම නිසා මෙම මාර්ගය උදෑසන 6 සිට සවස 6 දක්වා දිවා කාලයට හෝ සාමාන්‍ය ජනතාවට විවෘත කරදෙන ලෙස ඉල්ලා සිටීම. | මෙය කඳවුර හරහා යන මාර්ගයක් බැවින් ආරක්ෂක හේතුන් මත විවෘත කිරීමට අපහසු බව දන්වන ලදී. ජනාධිපති ලේකම් කාර්යාලයට හා ආරක්ෂක අමාත්‍යාංශයට මේ පිළිබඳව දැනුම් දීමට තීරණය විය.නැතහොත් ඒ වෙනුවට විකල්ප මාර්ගයක් ලබා දීමට තීරණය විය. |
| 12. | අම්/මඩවලලන්ද විද්‍යාලයේ උසස් පෙළ විද්‍යා විෂය ආරම්භ කිරීමට අවශ්‍ය භෞතික සම්පත් ලබා දී ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබියදී මෙතෙක් ආරම්භ කිරීමට නොහැකි වීම සහ විද්‍යා ගුරුවරුනගේ හිඟතාවයක් පැවතීම. | උපකරණ ලැබී තිබුනද විද්‍යා ගුරු හිඟය නිසාද, ගොඩනැගිල්ලේ කටයුතු අවසන් නොවීම නිසා ආරම්භ කිරීමට නොහැකිබව සඳහන් කරන ලදී. ඉදිරි බඳවා ගැනීම් වලදී මේ පාසල සලකා බලා ගුරුවරු ලබාදෙන ලෙස ප්‍රධාන ලේකම්තුමා වෙත දැනුම් දෙන ලදී. |
| 18. | ලංකා විදුලිබල මණ්ඩලයේ වහරු අංගනයක් (Poly Gantry) ඉදි කිරීම සඳහා මහඔය, 69හන්දියේ වී අලෙවි මණ්ඩලයේ ගබඩා සංකීර්ණය පිහිටි ඉඩමෙන් පර්චස් 10ක ප්‍රමාණයක් වෙන් කර ගැනීම | වී අලෙවි මණ්ඩලයේ නිලධාරී විසින් මේ සම්බන්ධයෙන් විදුලි බල මණ්ඩලය සමඟ සාකච්ඡාකර වී අලෙවි මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සමග කථා කර තීරණයක් ලබාදීමට පොරොන්දු විය. |
| 19. | නැගෙනහිර පළාත් සභාව යටතේ ඇති දිස්ත්‍රික් කාර්යාල අම්පාර නගරයට ගෙන ඒම තුළින් දෙහිඅත්තකණ්ඩිය, මහඔය, පදියතලාව වැනි දුර බැහැර කොට්ඨාසවලට අනුයුක්තව සේවය කරන නිලධාරීන්ට පහසුවක් ඇති වීම | මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කර වඩාත් සුදුසු තීන්දුවක් ගැනීමට පළාත් ලේකම්ට දැනුම් දෙන ලදී. |

| | | |
|---|---|---|
| 20. | සම්මන්තුර- නාවිදන්වෙලි, සම්මන්තුර-අම්පාර සීමා මායිමේ ගොවීන්ට අයත් කුඹුරු ඉඩම්වල පැවරීම් කටයුතු ප්‍රමාද වීම සම්බන්ධව | දිසාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ගැසට් නිවේදන මගින් වෙන්කර ගැනීමට කටයුතු කිරීමට තීරණය විය. |
| 21. | අම්පාර උපතැපැල් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා නව බස් නැවතුම්පල ගොඩනැගිල්ලේ කඩකාමරයක් ලබා දීම රජයේ අනුග්‍රහයෙන් සිදු කිරීම හා තැපැල් දෙපාර්තමේන්තුව ඒ සඳහා ගෙවීමට එකඟවන නියමිත ගාස්තුව අම්පාර නගර සභාවට අයවන ආකාරයට ගිවිසුම්ගතව අවශ්‍ය කටයුතු කිරීමට යෝජනා කිරීම | මේ සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඉල්ලා ලිපියක් යැවූ බව පළාත් පාලන කොමසාරිස් පවසන ලද අතර එය ලැබුණු විගස ඉදිරි කටයුතු කල හැකි බව ප්‍රකාශ කරන ලදී. |

**12. ස්තුති කථාව :**

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා විසින් පැමිණි සිටි සියලුදෙනාට ස්තුතිය පළකර රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර.

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

# දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම 2024.02.14

## පැමිණීමේ නාම ලේඛණය

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | සෙන්දිල් තොන්ඩමාන් | ආණ්ඩුකාරවර නැ/ප, සමසභාපති | |
| 02 | ඩබ්.ඩී. වීරසිංහ | සමසභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 03 | ඒ.එල්.එම්. අතාවුල්ලා | සමසභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 04 | විමලවීර දිසානායක | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 05 | එස්.එම්.එම්.මුෂාරෆ් | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 06 | තිලක් රාජපක්ෂ | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 07 | ටී.කලෛඅරසන් | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 08 | එච්.එම්.එම්.හාරිස් | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 09 | ෆයිසාල් කාසිම් | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 10 | චන්ද්‍රදාස ගලප්පත්ති | සභාපති | නැගෙනහිර පලාත් සභාව |
| 11 | චින්තක අබේවික්‍රම | දිසාපති / දිස්ත්‍රික් ලේකම් | දිස්ත්‍රික් ලේකම් - අම්පාර |
| 12 | ආර්.එම්.පී.එස්.රත්නායක | ප්‍රධාන ලේකම් | නැගෙනහිර පලාත් සභාව |
| 13 | ඩී.එම්.ආර්.සී.දසනායක | පලාත් ඉඩම් කොමසාරිස් | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| 14 | එස්. කෝනේස්වරන් | පලාත් අධ්‍යක්ෂ | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |
| 15 | එන්.මනිවනන් | ප්‍රධාන අමාත්‍ය ලේකම් | |
| 16 | එම්.එම්.ජී.බී.එම්.රෂාඩ් | පලාත් සම්බන්ධීකාරක | NDDCB |
| 17 | එම්.එස්.ඒ.කලීස් | පලාත් අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 18 | අයි.කේ.ඩී. මුතුබංඩා | ලේකම් | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 19 | එස්.බී.දිසානායක | DDA | කෘෂිකර්ම |
| 20 | එන්. තමිල් වෙල්වන් | DCS Planning | Planning |
| 21 | වෛද්‍ය එම්.ඒ.එම්. ෆෂී | PD | DAPH |
| 22 | එම්.ඒ.ලාල්කුමාර | ජ්‍යෙෂ්ඨ පරිවාස නිළධාරී | DPCCS - EP |
| 23 | පී.එම්.වයි.අරෆාත් | DDE | ZEO |
| 24 | එම්.එස්.එස්.නජීම් | ZDE | ZDE |
| 25 | ටි.සරිකරුපන් | DDE | ZEO |
| 26 | කේ.යෝගනාදන් | TO | RDD |
| 27 | කේ.ශිවකුමාර් | සමුද්‍ර පරිසර නිළධාරී | සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය |
| 28 | ඒ.කේ.නලීම් | විදුහල්පති | අක්කරපත්තු කලාප |
| 29 | ඩබ්.එම්.එච්.උදය කුමාර | අධ්‍යක්ෂ | නැ/ප ප්‍රවාහන |
| 30 | එස්.රවිකුමාර් | සහකාර අධ්‍යක්ෂ නැ/ප | NAQDA |
| 31 | ඒ.උඩපමුණුව | ප්‍රාදේශීය කළමණාකරු | P,M.B. |
| 32 | ජී.ඒ.ටී.සී.නිශාන් | A.R.M. | P,M.B. |
| 33 | කුලේන්ද්‍රන් කුමාර් | P.D.E. | P.D.E. Office |
| 34 | ටී.එම්.ඒම්. අන්සාර් | ප්‍රාදේශීය ලේකම් | අක්කරපත්තු |
| 35 | එස්.ටී.පී.වීරසිංහ | ප්‍රාදේශීය ලේකම් | දෙහිඅත්තකණ්ඩිය |
| 36 | ඒ.එම්.ඒ.කුමාරි | ප්‍රාදේශීය ලේකම් | අම්පාර |
| 37 | ඒ.එම්.ඒ.කුමාරි | ප්‍රාදේශීය ලේකම් | දමන |
| 38 | එම්.එස්.එම්. රෂාන් | ප්‍රාදේශීය ලේකම් | ඉරක්කාමම් |
| 39 | ජේ.ලියාකත් අලි | ප්‍රාදේශීය ලේකම් | කල්මුණ |
| 40 | එස්.ජෙගරාජන් | ප්‍රාදේශීය ලේකම් | කාරතිවු |

| | | | |
|---|---|---|---|
| 41 | තිලින වික්‍රමරත්න | ප්‍රාදේශීය ලේකම් | මහඔය |
| 42 | ආර්.රාහුලනයාහි | ප්‍රාදේශීය ලේකම් | නාවිතන්වෙලි |
| 43 | ඒ.එම්.අබ්දුල් ලතීෆ් | ප්‍රාදේශීය ලේකම් | නින්දවූර් |
| 44 | බී.වී.එස්. ගුණසේන | ප්‍රාදේශීය ලේකම් | පදියතලාව |
| 45 | එම්.අයි. පිර්නාස් | ප්‍රාදේශීය ලේකම් | පොතුවිල් |
| 46 | එස්.එල්.එම්.හනිෆා | ප්‍රාදේශීය ලේකම් | සමන්තුරෙයි |
| 47 | චින්තන උදාර නානායක්කාර | ප්‍රාදේශීය ලේකම් | උහන |
| 48 | එන්.නවනීතරාජා | ප්‍රාදේශීය ලේකම් | ලාහුගල |
| 49 | ටී.ජේ.අදිෂයිරාජ් | ප්‍රාදේශීය ලේකම් | කල්මුණ උතුර |
| 50 | ටී.ගජේන්ද්‍රන් | ප්‍රාදේශීය ලේකම් | තිරුක්කෝවිල් |
| 51 | ඒ.එම්.ආසික් | ප්‍රාදේශීය ලේකම් | සායින්දමරුදූ |
| 52 | කේ.ඒ. නලීන් | ACCD | Co-op |
| 53 | එස්. පරමේස්වරම් | අධ්‍යක්ෂ | LRC |
| 54 | ඒ.එල්.නියාස් | DIE-Pothuvil | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 55 | එම්.එච්.ඒ.අහමත් | DIE-Akkarapaththu | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 56 | එල්.පී.ඩී.පී.ජයසේකර | Registrar | හාඩි තාක්ෂණික ආයතනය |
| 57 | ඒ.පී.අයිරාංගනී | දිස්ත්‍රික් කළමණාකරු | NHDA Ampara |
| 58 | කේ.එල්.ඩී.එස්.පී.සෙනවිරත්න | ES | CEB |
| 59 | යූ.ඒ.බාරි | EE | RDA |
| 60 | පී.කේ.නානායක්කාර | SEAS | GOPL |
| 61 | කේ.එස්. තුෂාර | කච්චේරිය | කච්චේරිය |
| 62 | ඩී.එම්.නසාර් | AD/DFO | SEDD Ampara |
| 63 | එස්.එම්.ආර්.පී. දනන්ජය | Manager SDB Uhana | SDB Uhana |
| 64 | බී.එම්.ඩබ්.එම්. බංඩාර | SEO | CEA Ampara |
| 65 | ර්.එම්.ඩබ්.ජී. දිසානායක | ලේකම් | MOE |
| 66 | එස්. සතීෂ් කුමාර් | AD | AIB |
| 67 | ඒ.එම්.උවයිස් | PE | RDA |
| 68 | ටී.තේවරූල් | AO | BH Kalmunai - N |
| 69 | වෛද්‍ය ෆ්රෝස් | MO Planning | RDHS Ampara |
| 70 | ආර්.එම්.බී. මැණිකේ | MSO | RDHS Ampara |
| 71 | ඉංජි. ජී.සජිතරන් | නියෝජ්‍ය අධ්‍යක්ෂ | පලාත් වාරිමාර්ග |
| 72 | එස්.ගරන් | SAS | Ministry of Health |
| 73 | ඉංජි.ඒ.රාජේස්කන්නා | P/IE | පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 74 | ටී.එම්.සී.ඩී.විජේකුමාර | ARM | SLCC |
| 75 | ඩබ්.එම්.ඒ.මධුසංඛ | Aquaculture ex officer | NaQDA |
| 76 | එම්.එම්.මුනාස් | EE | RDD |
| 77 | ගුණතිලක | CO Mahaoya | CSD |
| 78 | එම්.ටී.ඒ. නහිස් | DRDO - Ampara | Rural Development EP |
| 79 | වෛද්‍ය ඒ.අස්මි ෂාහි | Mo Public health EP | RDHS kalmunai |
| 60 | එම්.ඒ.ජයා | ADFO | Forest |
| 81 | විජිතසිරි බංඩාර | ADFO | Forest |
| 82 | එච්.බී.පී.බංඩාර | DI Ampara | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 83 | බී.එල්.පී.යූ. සිල්වා | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී | මිනින්දෝරු දෙපාර්තමේන්තුව |
| 84 | කමල් නෙත්මිණ | ACLG | ACLG Ampara |
| 85 | ජේ.ඒ.එන්.ඩී. ජයසිංහ | Extension officer | Coconut cultivation Board |
| 86 | ඩබ්.වී.පී.කේ.ගයාෂාන් | CDO | Coconut cultivation Board |

| | | | |
|---|---|---|---|
| 87 | ඉංජි. ආර්.වෙල්කජන් | DIE sammanthura | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 88 | කේ.එල්.එම්.ස්මයිල් | CE ampara | RDA |
| 89 | ජී.ඩී.ඩී.ලක්මාල් | EE | RDA |
| 90 | එක්ස්.ටී.සම්පන්තන් | CEB kalmuna | CEB |
| 91 | ටී.සිවසුබ්‍රමනියම් | CE | RDA |
| 92 | ඒ.එල්.ෆරෝයි | Act. Ans | Health |
| 93 | ටී.එස්.ඩී.පීරිස් | ZDE | ZEO Dehiattakandiya |
| 94 | ආර්.ඥානවෙල්වා | DPD ASMP | ASMP |
| 95 | ඒ.එම්.පී.බංඩාර | AD NES | NES |
| 96 | ඩබ්.එම්.අයි.බී.විජේකෝන් | Statistician | කච්චේරිය |
| 97 | නිශාන්ත කුමාර | AD Planning | UDA |
| 98 | එන්.මතිවානන් | කොමසාරිස් | Co-op දෙපාර්තමේන්තුව |
| 99 | එච්.එම්.ඩී.ප්‍රසන්න | ADO | Agrarian Depatment |
| 100 | පී.පී.ගුණවර්ධන | Technician | Sierra |
| 101 | වෛද්‍ය .ඒ.කේ.එස්.ලක්මාල් | DD | DOA (inter province) |
| 102 | එම්.ආර්.එම්.ෆාරිස් | RME | GSMB |
| 103 | වෛද්‍ය. එම්.ඒ.නියාස් | Ay.focal point | RDHS kalmunai |
| 104 | ර්.ක්‍රිස්ටි දේශප්‍රිය | RPM | IMD |
| 105 | ඒ.එල්.අයි.හානු | ඉඩම් කොමසාරිස් | ඉඩම් කොමසාරිස් කාර්යාලය |
| 106 | කේ.එලන්කුමුදන් | PD | සමාජසේවා දෙපාර්තමේන්තුව |
| 107 | වෛද්‍ය ජේ.පොන්කරන් | PCIM | Dept.of IM |
| 108 | ඩබ්.ආර්.එස්.එස්.අබේරත්න | EPM | IDB |
| 109 | වෛද්‍ය ඩබ්.ජී.එස්.සංජීවනී | DAPH | DAPH |
| 110 | ජී.ඩබ්.ඒ.එස්. ජයසේකර | DEO | අපනයන කෘෂිකර්ම |
| 111 | එම්.පීතඑස්.තිලක | RPM Mahaoya | MASL |
| 112 | ඩී.එස්.මුතුයක් | FA | GSMB |
| 113 | වෛද්‍ය පී.මෝහනකාන්තන් | MOH thirukkovil | Health |
| 114 | ඉංජි. එස්.ජයපෙරතස්මන්ති | DIE Mahaoya | Irrigation |
| 115 | එන්.පී.එස්.ඩබ්.ජයරත්න | FMV | DMT |
| 116 | ඒ.එම්.ඉම්රන් | RPM | IMD Akkarapaththu |
| 117 | ආර්.එම්.අවියදම් | DPD | CSMP |
| 118 | එම්.අයි.ෆවුම් | AD land use | LUPPD |
| 119 | ඉංජි.රාජගෝපාලසින්ගම් | PD - Irrigation | P/ID |
| 120 | ඉංජි.පී.අඩිදූනුතන් | CE Kalmunai | Building Department EP |
| 121 | ඉංජි.එන්.කතීහන් | DD EP | RDD |
| 122 | ඉංජි. එන්.තිරුවරුඩහීලන් | Project Engi. | BCRIP.RDA |
| 123 | ඒ.එම්.රහමතුල්ලා | ZDE | Education |
| 124 | එම්.අයි.එම්.ෆාරීඩ | ACLD | Department of COOP |
| 125 | ඩී.එස්.ඒ. මුනසිංහ | AD | Archaeology |
| 126 | ඩබ්.ඒ.සී.එල්.වරෝසුන්දර් | DRPM | MASL |
| 127 | එන්.ශිරන්ජන් | AD | Department of fisheries |
| 128 | කේ.පී.එස්.ප්‍රියන්ත | Divisional S. SCpost | Div. supdt |
| 129 | එස්. කුමාර | Program officer | VTA Ampara |
| 130 | ඒ.එම්.අස්වි | DIE | Irrigation |
| 131 | එම්.බී.අලියාර් | PD | RDA |

| | | | |
|---|---|---|---|
| 132 | එස්.එල්. ආදම්භාවා | Chief Accountant | Kachcheriya Ampara |
| 133 | පී.එල්.විමලදාස | AD | Wildlife |
| 134 | ජී.එන්.ද සිල්වා | R/A | Wildlife |
| 135 | එම්.ඒ.සී.එම්.රියාස් | DD | DMC |
| 136 | ඉංජී.ජේ.ඒ.අබේ | RI | ID |
| 137 | එම්.පී.එම්.වික්‍රමසිංහ | දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරී | Sports |
| 138 | එස්.ආර්.හසන්ති | ZDE Ampara | Education |
| 139 | එම්.එස්.එන්. මොහොමඩ් | DDE | ZED thirukkovil |
| 140 | ජී.කේ.තනකනමූර්ති | Principal | Thirukkovil M.M.V. |
| 141 | එස්.ඒ.ඩී.ඩබ්.කුමාර | DIE Ampara | Irrigation |
| 142 | වී.පාපාකරන් | DS | Aliyadiwembu |
| 143 | වෛද්‍ය ටී.රාජේස් | MS | Health |
| 144 | එම්.අයි.එම්.ඉෂාක් | SEO | CEA |
| 145 | ඩබ්.තිලාන්තන් | AD | CCD |
| 146 | එන්.පී.සී.අයි. නිස්සන්ක | ZDE | Education |
| 147 | ඒ.ආර්.වරුසවිතාන | DO | Planning Kachcheriya |
| 148 | ඩබ්.එන්.ප්‍රනාන්දු | DO | Planning Kachcheriya |
| 149 | අසංක සිරි කුමාර | DO | Planning Kachcheriya |
| 150 | ඩබ්.ඒ.තුෂාර | DO | Planning Kachcheriya |
| 151 | ඉනෝකා | DO | Planning Kachcheriya |
| 152 | ඉමේෂා | MA | Planning Kachcheriya |
| 153 | එස්.ඒ.අයි.ඩී.ජයසේන | ලේකම් | ප්‍රාදේශීය සභාව - අම්පාර |
| 154 | ඩී.කේ.එම්.එම්.එම්. කුමාරිහාමි | ලේකම් | ප්‍රාදේශීය සභාව - නාමල්ඔය |
| 155 | ආර්.එම්.සිරිවර්ධන | ලේකම් | ප්‍රාදේශීය සභාව - ලාහුගල |
| 156 | පී.එච්.එම්.කේ.ප්‍රියදර්ශනී | ලේකම් | ප්‍රාදේශීය සභාව - දමන |
| 157 | එම්.ඒ.පී. මැදගොඩ | ලේකම් | ප්‍රාදේශීය සභාව - උහන |
| 158 | අයි.ජී.එස්.සී.කුමාරි | ලේකම් | ප්‍රාදේශීය සභාව - මහඔය |
| 159 | අයි.ජී.එස්.ජී කුමාරි | ලේකම් | ප්‍රාදේශීය සභාව - දෙහිඅත්තකණ්ඩිය |
| 160 | එල්.එම්.ඉර්ෆාන් | ලේකම් | ප්‍රාදේශීය සභාව - අක්කරපත්තු |
| 161 | හබීබුරාහමන් | ලේකම් | ප්‍රාදේශීය සභාව - පොතුවිල් |
| 162 | එම්.ආර්.එම්.රෂීඩ් | ලේකම් | ප්‍රාදේශීය සභාව - නින්දවුර් |
| 163 | එස්. පහීරතන් | ලේකම් | ප්‍රාදේශීය සභාව - නාවිදන්වෙලි |
| 164 | එම්.අය්.එම්. ෆායිස් | ලේකම් | ප්‍රාදේශීය සභාව - අඩ්ඩාලච්චේන |
| 165 | අයි. සුරේස්රම් | ලේකම් | ප්‍රාදේශීය සභාව - අලයාඩිවෙම්බු |
| 166 | ජේ. වීරපතිරණ | ලේකම් | ප්‍රාදේශීය සභාව -තිරුක්කෝවිල් |
| 167 | ඒ.සුන්දරකුමාර් | ලේකම් | ප්‍රාදේශීය සභාව - කාරතිව් |
| 168 | මොහොමඩ් | ලේකම් | නගරසභාව - සම්මන්තුර |
| 169 | ඒ.ටී.එම්.රෆී | නාගරික කොමසාරිස් | මහ නගරසභාව - අක්කරපත්තු |
| 170 | ඒ.එල්.එම්.අස්මි | නාගරික කොමසාරිස් | මහ නගරසභාව - කල්මුණ |
| 171 | යශෝදන | DO | Planning Kachcheriya |
| 172 | අක්රම් | DO | Planning Kachcheriya |
| 173 | ෆ්රෝස් | DO | Planning Kachcheriya |
| 174 | අසාද් | DO | Planning Kachcheriya |
| 175 | අප්පුදන් | DO | Planning Kachcheriya |
| 176 | මලර් | MA | Planning Kachcheriya |